**ඒකාබද්ධ ප්‍රකාශනය**

**ශ්‍රී ලංකාව සඳහා වූ මාධ්‍ය ඇගයීමේ අන්තර්ජාතික ධූත මෙහෙවර**

**2015 මැයි 14**

*ශ්‍රී ලංකාව සඳහා වූ අන්තර්ජාතික මාධ්‍ය ඇගයීම් මෙහෙයුම **2015** මැයි **8**වැදි දින සිට **14**වැනි දින දක්වා යාපනය ඇතුළු ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ තත්ත්වය ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරයක් සිදු කරන ලදී. ARTICLE 19, නීතිය හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ කේන්ද්‍රය (CLD), ජනමාධ්‍යවේදීන්ගේ අන්තර්ජාතික සම්මේලනය (IFJ&, අන්තර්ජාතික මාධ්‍ය සහයෝගය (IMS), ස්වාධීන ජනමාධ්‍යවේදය පිළිබඳ විවෘත සමාජ පදනම වැඩසටහන (OSF), දකුණු ආසියානු මාධ්‍ය ඒකාබද්ධතා ජාලය (SAMSN) සහ UNESCO යන ආයතන ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ අනුග්‍රහය ඇතිව මෙම අන්තර්ජාතික ධූත මෙහෙවර නියෝජනය කළහ.*

*2015 ජනවාරි  මස 8වැනි දින නව රජය බලයට පත්වීමෙන් පසු මාධ්‍ය නිදහස සඳහා වූ වැදගත් ධනාත්මක වෙනස්කම් ඇතිවී තිබනේ බව අන්තර්ජාතික මෙහෙයුම සාදරයෙන් පිළිගනී. මාධ්‍ය ආයතන සහ ජනමාධ්‍යවේදීන්ට එරෙහිව තිබූ තර්ජනය හා පීඩනය අවසන් කිරීමට පියවර ගැනීම, වෙබ් අඩවි තහනම ඉවත් කිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා නෛතික ආරක්ෂාව සැලසීමට පියවර ගැනීම, රටින් පිටුවහල් කළ ජනමාධ්‍යවේදීන්ට නැවත රටට පැමිණෙන ලෙසට ආරාධනා කිරීම සහ රාජ්‍ය මාධ්‍ය සඳහා සාපේක්ෂව වැඩි කර්තෘ නිදහසක් ලබාදීම මේවාට ඇතුලත් වේ. මෙම මෙහෙයුම අතරතුර දී අප හමු වූ පුළුල් පරාසයක පාර්ශවකරුවන් විසින් මෙම වැඩිදියුණුවීම් හඳුනා ගෙන, ඒ පිළිබඳ සතුට පළකළහ.*

එමෙන්ම, මෙහෙයුම අතරතුර දී අප හමු වූ - අග්‍රාමාත්‍ය, රනිල් වික්‍රමසිංහ මහතා, බුද්ධසාසන, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන සහ ප්‍රජාතාන්ත්‍රික පාලනය පිළිබඳ අමාත්‍ය ගරු කරු ජයසූරිය මහතා සහ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය ගරු ගයන්ත කරුණාතිලක මහතා යන - රාජ්‍ය නායකයින් විසින් පිළිගත් ආකාරයට මාධ්‍ය සඳහා වූ සමස්ත පරිසරය මගින් භාරගන්නා ප්‍රකාශනයේ නිදහස පිළිබඳ අයිතිවාසිකම අන්තර්ජාතික ප්‍රමිති අනුව තහවුරු කිරීම පිණිස සහ ශ්‍රී ලාංකික සන්දර්භය තුළ ශක්තිමත්, බහුත්වවාදී වෘත්තීය මාධ්‍යයක වර්ධනය සඳහා වූ ශක්තිමත් පදනමක් සැලසීම වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යයන් රැසකි.

පුද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකේම මාධ්‍යයෙන් වැඩි ප්‍රමාණයක් අධික ලෙස දේශපාලනීකරණයවීම සහ සංස්කාරකවරු හා වෘත්තීය පත්‍රකලාවේදීන් යන කොට්ඨාස දෙකේම අය අත්විඳි කර්තෘ නිදහස අහිමිවීම යන කරුණු පිළිබඳව මෙහෙයුම දැනුවත් විය. ජනමාධ්‍යවේදීන්ගේ හැකියාවන්, ශාස්ත්‍රීය පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ ජනමාධ්‍යවේදීන් සඳහා වූ ගුණාත්මක පුහුණු ඉඩප්‍රස්ථාවන් නොතිබීම වැනි ගැටළු මධ්‍යයේ මාධ්‍යයේ වෘත්තීය ප්‍රමිතීන් සම්බන්ධව සැලකීමේ දී බරපතල අභියෝගයක් පවතී. බොහොමයක් ජනමාධ්‍යවේදීන් ලබන අඩු වැටුප් හා දුර්වල සේවා තත්ත්වයන් හා ප්‍රතිලාභ, වෘත්තීය සමිතිවලට බැඳීමේ අයිතියට ඇති බාධාවන්, ආචාරධර්ම ප්‍රමිතීන් අනුගමනය කිරීමට අපොහොසත්වීම පක්ෂග්‍රාහී

වාර්තාකරණය සහ 'ජාතිභේදවාදය' පිළිබඳ සංස්කෘතියක් තිබීම වැනි අවස්ථාවන් ඇතුලත් මාධ්‍ය තුළ දක්නට ලැබෙන වාර්ගික බේදීම් මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර කිරීමට හේතු සාධක වේ. ජනමාධ්‍යවේදීන් වෙත එල්ල වූ ශාරීරික තර්ජන පසුගිය මාස හතරක කාලය තුළ දී අඩු වුව ද ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල බොහොමයක් ජනමාධ්‍යවේදීන් තවමත් අත්විඳින අවදානම් හා අනාරක්ෂිත තත්ත්වයන් තුළ, මාධ්‍ය වෘත්තිකයින් මරාදැමීමේ, අතුරුදහන් කිරීමේ සහ ඔවුන්ට ශාරීරික තර්ජන එල්ල කිරීමේ අවස්ථාවන් පිළිබඳව කිසිවෙකු දඬුවම් නොකිරීමේ ඉහළ මට්ටම් කෙරෙහි ද සැලකිල්ල යොමු කිරීම ඉතා වැදගත් වේ.

මෙම සාධක හේතුවෙන් රාජ්‍ය සහ බලවත් සාමාජීය ක්‍රියාකාරීන් පිළිබඳව අධීක්ෂණය කිරීමේ හා මහ ජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය සතු කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය සතු හැකියාව බරපතල ලෙස යටපත් කිරීමට හේතු වේ. මෙම ගැටළු ඇතුළු වෙනත් කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ශ්‍රී ලංකා රජය සහ වෙනත් පාර්ශවයන්ට සහායවීමේ පරමාර්ථය ඇතිව අන්තර්ජාතික මෙහෙයුම විසින් පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. මෙම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සිදු කළ යුත්තේ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වවල පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇති පුළුල් උපදේශන ක්‍රියාවලියකට පසුව පමණි. මෙම සියලුම යෝජනා සඳහා අප හමු වූ රාජ්‍ය නායකයින්ගේ සහයෝගය ලැබූ බව විශේෂයෙන් සඳහන් කරමු.

1. විද්‍යුත් මාධ්‍ය විකාශනය සහ නියාමනය පිළිබඳ විස්තීරණ නෛතික විධිවිධාන ප්‍රකාශනයේ නිදහස පිළිබඳ අන්තර්ජාතික සහතිකවලට අනුකූලව සම්මත කර ගත යුතුය. මෙමඟින්, වෙනත් දේ අතර, ඩිජිටල් සම්ප්‍රේෂණය අතරතුර ස්වාධීන ආයතනයක් විසින් විකාශනය නියාමනය කිරීම, මහජන, වාණිජ සහ ප්‍රජා විද්‍යුත් මාධ්‍ය පිළිගන්නා ත්‍රිවිධ පද්ධතියන් මහජනයාට වැදගත් වන දේශපාලන හා වෙනත් කරුණු ආවරණය කිරීමේ දී සාධාරනත්වය හා අපක්ෂපාතීවීම, ඇතුළු විකාශකනය සඳහා වෙන් කර ඇති සංඛ්‍යාත සම්බන්ධ නිසි සැලසුම්කරණය සඳහා ඉඩ සැලසිය යුතුය.

2. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (SLRC), ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව (SLBC) සහ ස්වාධීන රූපවාහිනී ජාලය (ITN) යන රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය, කර්තෘ ස්වාධීනත්වය භුක්ති විඳින, මහජනතාවට සේවය කිරීම වෙනුවෙන් පැහැදිලි පැවරුම් බලයක් සහිත සහ ඔවුන්ගේ ස්වාධීනතාවය හීන නොකරන මහජන අරමුදල් මඟින් ප්‍රතිලාභ ලබන ස්වාධීන මහජන සේවා විකාශකයින් (Public Service BroadÊster) බවට පරිවර්තනය කළ යුතුය.

3. රාජ්‍ය මුද්‍රිත මාධ්‍ය කණ්ඩායම වන - සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට (ANCL) ද රජයේ බලපෑමකින් තොරව ස්වාධීනව කටයුතු කිරීමට හා කර්තෘ නිදහස භුක්ති විඳීමට හැකියාව තහවුරු කරන පියවර ගත යුතුය. මෙය ඉටු කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය තීරණය කිරීම සඳහා පුළුල් මහජන උපදේශනයක් පැවැත්විය යුතුය.

4. රජයේ ආයතන  සහ මහජන අරමුදල් ලබන හෝ රජයේ පාලනයට යටත්වන වෙනත් අධිකාරීන් සතු තොරතුරු වෙත ප්‍රවේශය ලබා ගැනීම සඳහා පුද්ගලයින්ට අයිතියක් ලබා දෙන, අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන තොරතුරු ලබා ගැනීමේ අයිතිය පිළිබඳ නීතියක් සම්මත කර ගත යුතු වන අතර පසුව නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතුය.

5. වගකිව යුතු තැනැත්තන්ට විරුද්ධව නඩු පවරනු ලැබීම සහ වින්දිතයින්ට හා ඔවුන්ගේ පවුල්වලට නිසි වන්දියක් ගෙවනු ලැබීම තහවුරු කිරීම පරමාර්ථය කර ගත් ජනමාධ්‍යවේදීන්, මාධ්‍ය වෘත්තීයවේදීන් සහ මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් වූ ජනමාධ්‍යවේදීන් මරා දැමීම, ඔවුන්ට තර්ජනය කිරීම, ඔවුන් අතුරුදහන් කිරීම සහ ඔවුන්ට පහරදීම ආදිය සම්බන්ධ අතීත සිදුවීම් විමර්ශනය කිරීම සඳහා පැවරුම් බලයක් හා ප්‍රමාණවත් බලතල සහිත ස්වාධීන විමර්ශන කොමිෂන් සභාවක් ඇති කළ යුතුය.

6. පුවත්පත් මණ්ඩල පනත අවලංගු කළ යුතු වන අතර රජය විසින් පාලනය කරනු ලබන පුවත්පත් මණ්ඩලය අහෝසි කළ යුතුය. මුද්‍රිත හා විකාශන යන අංශ දෙකේම වෘත්තීය හැසිරීම සම්බන්ධව වූ පැමිණිලි ආමන්ත්‍රණය කරනු ලබන ස්වාධීන හා පලදායී ක්‍රමයක් තහවුරු කිරීම සඳහා පියවර ගත යුතුය.

7. නව සමිති සාමාජිකයින් වෙනුවෙන් කරුණු සාකච්ඡා කිරීමට සහ පෙනී සිටීම සඳහා වූ වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය වෘත්තිකයින්ට ඇති අයිතිවාසිකම මාධ්‍ය හිමිකරුවන් විසින් පිළිගෙන ඒ සඳහා අනුග්‍රහය දැක්විය යුතුය.

8. ජනමාධ්‍යවේදීන්ගේ සහ මාධ්‍ය වෘත්තිකයින්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීමේ ක්ෂේත්‍රවල අවශ්‍යතාවන් හඳුනා ගැනීම සඳහා වූ, උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්වවල පුලුල් උපදේශනයක් පැවැත්විය යුතු වන අතර මෙම අවශ්‍යතාවන් ඉටු කර ගැනීම ඉලක්ක කර ගත් නිශ්චිත පියවර මාලාවක් අනුගමනය කළ යුතුය.

9. මාධ්‍යවල අන්තර්ගතය පිළිබඳව වූ සිවිල් හා අපරාධ නීති සීමාවන්, ප්‍රකාශනයේ නිදහස පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල මට්ටමට ගෙන ඒම සඳහා මාධ්‍ය නීතිවල අන්තර්ගතය සමාලෝචනය කළ යුතුය. මේ තත්ත්වය තුළ, දැනට ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කළ යුතු වන අතර ප්‍රකාශනයේ නිදහසට ගරු කිරීම සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ අවශ්‍යතාව අතර නිසි තුලනයක් ඇති කරන පනතක් සුපරීක්ෂාකාරීව සකස් කළ යුතුය. එමෙන්ම අධිකරණයට අපහාස කිරීම සම්බන්ධ නිසි සම්මුති ඇති කර ගැනීම හරහා ඒ සම්බන්ධ පැහැදිලි නීතියක් සම්මත කළ යුතුය.